# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 අගෝස්තු මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

(2024.08.05 දින නිකුත් කරන ලදී)


# ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය දැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාවේ නියාමන කමිටුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 72.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය
සඳහා වන කොමිෂන් සභාව

එල්.ඩී-.ඕ. 63/2024

**ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය දැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීමේ කාර්යය සඳහා කොමිෂන් සභාවේ නියාමන කමිටුව පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, සියලු තැනැත්තන්ගේ සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම සහ සමාන ලෙස නීතියේ රැකවරණය සඳහා වූ අයිතිවාසිකම ද ඇතුළු ව ශ්‍රී ලංකිකයන්ගේ නෛසර්ගික අභිමානය සහ සමාන සහ අහිමි කළ නොහැකි මූලික අයිතිවාසිකම් සහ ඒ අයිතීන්ට ගරු කිරීම, ඒ අයිතීන් ප්‍රවර්ධනය කිරීම සහ ඒවා ආරක්ෂා කිරීම සඳහා වන රජයේ වගකීම පිළිගන්නා හෙයින් ද:

ඵලදායී පිළියමක් සඳහා වූ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකමෙහි අත්‍යවශ්‍ය අංගයක් වන මෙහි දක්වා ඇති කාරණා පිළිබඳව සත්‍යය දැනගැනීම සඳහා ඔවුන්ට ඇති අයිතිවාසිකම සමඟ බැඳී ඇති සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයක්, අනාගත පරම්පරාවන් ද ඇතුළුව සියලු ශ්‍රී ලාංකිකයන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව උදෙසා ජාතික සමගිය, සාමය, නීතියේ ආධිපත්‍යය, සහජීවනය, ඉවසීම සමඟ වූ සමානාත්මතාව සහ විවිධත්වය සඳහා ගරු කිරීම හා ශ්‍රී ලාංකික ජනතාව අතර ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ අසමගිය හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම සඳහා දායක වනු ඇති හෙයින් ද:

මූලික අයිතිවාසිකම් සහ යුතුකම්වලට ගරු කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකා ආණ්ඩුවේ සියලු ආයතනවල මූලික අරමුණ වන හෙයින් ද; නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ස්ථිරසාර ජනරජ මූලධර්ම තහවුරු කිරීම සඳහා ගෞරව බහුමානයෙන් යුතු ව අධිෂ්ඨානය කරන ලද හෙයින් ද; ශ්‍රී ලාංකික ජනතාවගේ මතු

පරම්පරාවල ද අභිමානය සහ යහපැවැත්ම සහතික කෙරෙන අස්පර්ශනීය උරුමයක් ලෙස නිදහස, සමානාත්මතාවය, යුක්තිය, මූලික අයිතිවාසිකම්, සියලු ජනතාවට සහතික කරනු ලබන හෙයින් ද; සත්‍යය සෙවීමේ ජාතික ප්‍රතිපත්තියක් මගින් සහ ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය අභිවර්ධනය කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිළිගෙන ඇති නිදහස, සමානාත්මතාවය, යුක්තිය, මූලික අයිතිවාසිකම් සහ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව ශ්‍රී ලංකාවේ සියලු ජනතාව වෙත රජය විසින් සහතික වීම තවදුරටත් තහවුරු කරනු ලබන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2024 අංක      දරන ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට මාස දෙකක් ඉකුත් වන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පිහිටුවීම

ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව පිහිටුවීම

**2.** (1) (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ සත්‍යය, සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන්, එය විසින් ද, එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව කොමිෂන් සභාවේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි එය වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අත්සන මගින් සත්‍යවත්භාවය සහතික කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාව කොළඹ පිහිටුවනු ලැබිය යුතු අතර, එහි රැස්වීම් වාර ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක පවත්වනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, අවශ්‍ය පරිදි ප්‍රාදේශීය කාර්යාල පිහිටුවනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ සංයුතිය

**3.** (1) කොමිෂන් සභාව, සාමාජිකයන් හත් දෙනෙකුට නොඅඩු සහ සාමාජිකයන් විසි එක් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර, ඔවුන් සියලු දෙනා ම ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සංයුතිය මගින් ස්ත්‍රී පුරුෂභාවය ඇතුළුව ශ්‍රී ලංකාවේ බහුවිධ ස්වභාවය පිළිබිඹු කරනු ලැබිය යුතු අතර, සියලු සාමාජිකයන්, නීතිය, මූලික අයිතිවාසිකම් සහ මානවවාදී නීතිය, ඉතිහාසය, සමාජ විද්‍යා, මනෝවිද්‍යාව, විමර්ශන, පශ්චාත් ගැටුම් නිරාකරණ අධ්‍යයනය සහ ළමා අයිතිවාසිකම් සම්බන්ධ විෂය ක්ෂේත්‍ර පිළිබඳ ඇති දැනුම සහ ප්‍රායෝගික පළපුරුද්ද මත පදනම්ව පත් කරනු ලබන අවංකත්වයෙන් සහ විශ්වසනීයත්වයෙන් යුත් තැනැත්තන් විය යුතු අතර, කොමිෂන් සභාවේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අදාළ වන වෙනත් සුදුසුකම් ඔවුන් සතුව තිබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට අදහස් කරනු ලබන යම් තැනැත්තකු විසින් හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට යෝග්‍ය යැයි තමන්

විසින් සලකනු ලබන වෙනත් යම් සුදුසු තැනැත්තකු නම් කිරීමට අපේක්ෂා කරනු ලබන යම් තැනැත්තකු විසින්, එසේ පත් කරනු ලැබීම සඳහා වන ස්වකීය අදහස ප්‍රකාශ කරමින් හෝ වෙනත් යම් තැනැත්තකු නම් කරමින්, මේ පනත යටතේ සාදනු ලබන රීතිවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය යටතේ සිය නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, (2) වන උපවගන්තියේ විධිවිධාන කෙරෙහි නිසි අවධානයක් යොමු කරනු ලැබිය යුතු අතර, (3) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(6) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, ජනාධිපතිවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනෙකුගේ නම් අතරින් එක් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය සහ සාමාජිකයන් ඉවත් කිරීම

**4.** (1) (2) වන උපවගන්තිය යටතේ ඒ සාමාජිකයා විසින් කලින් ධුරය හිස්කරනු ලබන්නේ නම් මිස, කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු විසින් ම, 9 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ ධුර කාලය අවසන් වන දිනය දක්වා ධුරය දරනු ලැබිය යුතු ය.

(2) යම් සාමාජිකයකුගේ ධුරය -

(අ) ඒ සාමාජිකයා මියයාම;

(ආ) ඒ සාමාජිකයා විසින්, ජනාධිපතිවරයා වෙත ලිඛිතව යොමු කරනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වීම;

(ඇ) (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් මත ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කිරීම; හෝ

(ඈ) කොමිෂන් සභාවේ කාලසීමාව ඉකුත් වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සාමාජිකයකුගේ ධුර කාලය ඉකුත් වීම,

හේතුවෙන් හිස්වනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත්වන්නේ නම්;

(ආ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයන් මගින් බුන්වත් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබ ඇත්නම්;

(ඇ) කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් වූ ස්වකීය කාර්ය සමග සම්බන්ධතා ගැටුමක් ඇති බවට තීරණය කරනු ලැබ ඇත්නම්;

(ඈ) මානසික හෝ ශාරීරික අශක්නුතාවකට පත්වීම හේතුවෙන් ධුරයේ අඛණ්ඩව කටයුතු කරගෙන යාමට යෝග්‍ය නොවන බවට වෛද්‍යමය වශයෙන් සහතික කරනු ලැබ ඇත්නම්;

(ඉ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් සිහි විකල් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඊ) අධිකරණයක් මගින් යම් අපරාධ වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම්;

(උ) කොමිෂන් සභාවේ අවසරය ලබා නොගෙන අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණ ඇත්නම්; හෝ

(ඌ) අඛණ්ඩව මාස තුනක් ඉක්මවන කාලසීමාවක් සඳහා ධුරයේ කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී ඇත්නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟත්වය ඇතිව ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ එකී සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, සභාපතිවරයාගේ ධුර කාලය, 9 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ ධුර කාලය විය යුතු ය.

(6) රෝගාතුර වීම හෝ වෙනත් දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ එවැනි වෙනත් යම් හේතුවක් නිසා ධුරයේ කාර්ය ඉටු කිරීමට කොමිෂන් සභාවේ සභාපතිවරයා තාවකාලිකව

අපොහොසත් වන්නේ නම්, ජනාධිපතිවරයා විසින් සභාපතිවරයාට ස්වකීය ධුරයේ නැවත කටයුතු කිරීමට හැකිවන තෙක් ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් සභාපතිවරයාගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලබන තෙක්, කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ඔවුන් අතුරින් සාමාජිකයකු එකී ධුරයේ කටයුතු කිරීම සඳහා තෝරා ගනු ලැබිය යුතු ය.

(7) රෝගාතුර වීම හෝ වෙනත් දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ එවැනි වෙනත් යම් හේතුවක් නිසා ධුරයේ කාර්ය ඉටු කිරීමට කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, ජනාධිපතිවරයා විසින් එකී සාමාජිකයාට ස්වකීය ධුරයේ නැවත කටයුතු කිරීමට හැකිවන තෙක් ඔහු වෙනුවට කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තියේ 6 වන සහ 7 වන උපවගන්ති ප්‍රකාරව සිදු කරනු ලබන වැඩ බැලීමේ පත්කිරීම් සම්බන්ධයෙන් 3 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(9) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීම පිළිබඳ දෝෂයක් පැවතීම හේතුව නිසාම පමණක් කොමිෂන් සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු බවට සලකනු නොලැබිය යුතු ය.

පූර්ණ කාලීන සාමාජිකයන්

**5.** කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ අවම වශයෙන් වෙනත් සාමාජිකයන් තිදෙනෙකු පූර්ණ කාලීනව කටයුතු කරනු ලැබිය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පූර්ණ කාලීන පදනම මත පත්කරනු ලබන සාමාජිකයන් කවුරුන් ද යන්න නම් කරනු ලැබිය යුතු ය.

තොරතුරු නිලධරයා හා නම් කළ නිලධරයා

**6.** කොමිෂන් සභාව විසින්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ කාර්යය සඳහා "තොරතුරු නිලධරයකු" සහ "නම් කළ නිලධරයකු" පත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම් වාර

**7.** (1) කොමිෂන් සභාව විසින්, 12 වන වගන්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් තොරතුරු හා කරුණු භාරගැනීම, ලබාගැනීම සහ එක්රැස් කිරීම සඳහා, 2 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි රැස්වීම් වාර පවත්වනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත මූල මණ්ඩල මගින් විමර්ශන සහ පරීක්ෂණ පවත්වනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් සාමාජිකයන් මූල මණ්ඩල වෙත පත් කරනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ඒ මූල මණ්ඩලයේ එක් සාමාජිකයකු මූල මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් නම් කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සියලු රැස්වීම් වාර, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ප්‍රසිද්ධියේ පවත්වනු ලැබිය යුතු අතර, සියලු තැනැත්තන්ට ඒ රැස්වීම් වාරවලට බාධාවකින් තොරව සහභාගී වීමට ඉඩ ලබා දිය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, ස්වකීය අභිමතය පරිදි, යෝග්‍ය යැයි සලකනු ලබන කවර අවස්ථාවක දී වුව ද-

(අ) ලිංගික කාරණා පිළිබඳව වූ නඩු කටයුතුවල දී;

(ආ) ජාතික ආරක්ෂාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිස;

(ඇ) යම් තැනැත්තකුගේ පෞද්ගලික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස;

(ඈ) රහස්‍යභාවය සහතික කිරීම හෝ සත්‍යය ප්‍රකාශ කිරීම සඳහා උචිත පරිසරයක් නිර්මාණය කිරීම තහවුරු කිරීම පිණිස;

(ඉ) කොමිෂන් සභා පරිශ්‍රයේ සීමා තුළ සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාම තහවුරු කිරීම පිණිස; හෝ

(ඊ) දැනට සිදු කෙරෙමින් පවතින හෝ අනාගතයේ දී සිදු කිරීමට නියමිත නීති කෘත්‍යයන් කෙරෙහි අගතියක් වීමේ අවදානමක් ඇති අවස්ථාවක දී,

ඇතුළුව, එහි කටයුතු කෙරෙහි ඍජු සම්බන්ධතාවක් නොදක්වන හෝ ඍජු මැදිහත්වීමක් නොමැති තැනැත්තන් හෝ කොමිෂන් සභාව විසින්, විශේෂයෙන්ම යම් තැනැත්තකුගේ පෞද්ගලික ආරක්ෂාව

තහවුරු කිරීම පිණිස, බැහැර කිරීම අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන වෙනත් යම් තැනැත්තන් ඉන් බැහැර කරනු ලැබිය හැකි ය.

(5) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, (4) වන උපවගන්තියේ සඳහන් පරිදි සංවෘත රැස්වීම් වාර පවත්වනු ලබන අවස්ථාවක දී හෝ තොරතුරු ලබාගන්නා අවස්ථාවක දී, ඒවා ප්‍රකාශයට පත් කිරීම මගින් යම් තැනැත්තකුගේ ආරක්ෂාවට තර්ජනයක් විය හැකි හෝ ජාතික ආරක්ෂාව හෝ මහජන ආරක්ෂාව අනතුරෙහි හෙළන එවැනි තොරතුරු හෝ ඉන් යම් කොටසක් කිසිදු ආකාරයකට ප්‍රසිද්ධියට පත් නොකළ යුතු අතර, කිසිදු තැනැත්තකු විසින් ඉහත කී සංවෘත රැස්වීම් වාර වලට සම්බන්ධ නොවූ වෙනත් යම් පාර්ශ්වයකට එවැනි තොරතුරු කිසියම් ආකාරයකට හෙළිදරව් නොකළ යුතු ය:

එසේ වුව ද, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුගේ ආරක්ෂාව හෝ සම්බන්ධතා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පරිදි, එම රැස්වීම් වාරවල කටයුතු හෝ ඒ තොරතුරුවල කොටස් සංස්කරණය කිරීමෙන් පසු ඒ කටයුතු හෝ තොරතුරු පිළිබඳ වාර්තාවක් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි සැලකෙන පරිදි, එහි කටයුතු සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබිය යුතු ය. කොමිෂන් සභාව විසින්, අවශ්‍ය යයි සලකනු ලබන පරිදි ඒ කටයුතුවල සමගාමී සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් වූ භාෂණ පරිවර්තන හෝ භාෂා පරිවර්තන සපයනු ලැබිය යුතු ය. අවශ්‍ය අවස්ථාවන් හි දී කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ කටයුතුවලට සහභාගී වන ශ්‍රවණ දුබලතා සහිත තැනැත්තන් හට සහාය වීම සඳහා අතිරේක වශයෙන් සංඥා භාෂාව භාවිත කරනු ලැබිය හැකි ය.

(7) කොමිෂන් සභාවේ සියලු කටයුතු, ලිඛිතව මෙන් ම ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය-දෘශ්‍ය වාර්තා ආකාරයෙන් එම වචනයෙන් ම වාර්තා කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම්

**8.** (1) කොමිෂන් සභාවේ කටයුතු සලකා බැලීම සහ සාකච්ඡා කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් අවම වශයෙන් සති දෙකකට වරක්වත් රැස්විය යුතු ය:

එසේ වුව ද, යම් රැස්වීමක් සඳහා තමා ම සහභාගී වීමට නොහැකි වන යම් සාමාජිකයකු දුරකතනය හෝ වීඩියෝ සබැඳියක් මගින් හෝ වෙනත් එවැනි තාක්ෂණික පහසුකම් මාර්ගයෙන් ඒ රැස්වීම සඳහා සහභාගී විය හැකි ය.

(2) කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් සියලු රැස්වීම්වල දී මුලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක් සඳහා සභාපතිවරයා නොපැමිණෙන අවස්ථාවක දී, එම රැස්වීමට පැමිණ සිටින කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එක් අයෙකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ රැස්වීම්වල හෝ රැස්වීම් වාර වල ගණපූරණය, කොමිෂන් සභාවට එම අවස්ථාව වන විට පත් කරනු ලැබ ඇති මුළු සාමාජිකයන් සංඛ්‍යාවෙන් බහුතරය විය යුතු අතර, එය කිසිදු අවස්ථාවක දී සාමාජිකයන් පස් දෙනෙකුට නොඅඩු විය යුතු ය.

(4) කොමිෂන් සභාව ඉදිරියේ පවතින යම් කාරණයක් පිළිබඳව තීරණයක්, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක දී සභාපතිවරයාට හෝ යම් රැස්වීමක මුලසුන දරන සාමාජිකයාට පෞද්ගලික ඡන්දයට අමතරව තීරක ඡන්දයක් හිමිවිය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් එහි රැස්වීම්වල සියලු කටයුතු පිළිබඳ වාර්තා, ඒවා වාර්තා කිරීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන වාර්තාවල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබිය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත් ව, කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ රැස්වීම් සහ රැස්වීම් වාර පැවැත්වීම, කොමිෂන් සභාවේ කාර්ය සහ කටයුතු ඉටුකිරීම සම්බන්ධ කාර්යපටිපාටිය සහ නීතියට යටත් ව, එහි නිලධරයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ විනය ක්‍රියාපටිපාටිය නියාමනය කරනු ලැබිය හැකි ය.

**9.** 51 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ ධුර කාලය, නියමිත දිනයේ සිට වසර පහක් විය යුතු ය: කොමිෂන් සභාවේ ධුර කාලය

එසේ වුව ද, කොමිෂන් සභාවේ ධුර කාලය දීර්ඝ කිරීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා විසින් සලකනු ලබන්නේ නම්, ජනාධිපතිවරයා

විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ එකඟතාවය ඇතිව වරකට එක් වසරක කාලසීමාව බැගින් වූ වැඩිදුර කාල සීමාවක් සඳහා කොමිෂන් සභාවේ ධුර කාලය දීර්ඝ කරනු ලැබිය හැකි අතර, එම දීර්ඝ කරනු ලබන කාල සීමාවල එකතුව වසර දෙකක් නොඉක්මවිය යුතු ය.

මහජනතාව වෙත දැනුම් දීමේ කාර්යය

**10.** කොමිෂන් සභාව පිහිටුවන ලද දිනයේ සිට සහ එහි පැවැත්ම ඇති තාක්, කොමිෂන් සභාව විසින්, එහි පැවැත්ම සහ එහි අරමුණු පිළිබඳ මහජනතාවට දැනුම් දීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව පාලනයට හෝ විධානයට යටත් නොවන බව

**11.** මේ පනත යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී, එය ස්වාධීන ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, යම් තැනැත්තකුගේ හෝ අධිකාරයක පාලනයට හෝ විධානයට යටත් නොවිය යුතු ය.

## II වන කොටස

## කොමිෂන් සභාවේ අරමුණු සහ කාර්යභාරය

කොමිෂන් සභාවේ අරමුණු සහ කාර්යභාරය

**12.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින්, 1983 සිට 2009 දක්වා වූ කාලසීමාව තුළ උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ ගැටුම අතරතුර දී හෝ ඒ හා සාධාරණ ලෙස සම්බන්ධව හෝ එහි ප්‍රතිඵලයක් ලෙස හෝ එහි පසුවිපාක වශයෙන් ශ්‍රී ලංකාවේ කවර හෝ ස්ථානයක දී තැනැත්තන්ට හෝ දේපළකට සිදු වූ අලාභයකට හෝ හානියකට, ජීවිත හානියකට හෝ සිදුව ඇතැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට අදාළ යම් ලිඛිත නීතියකට අනුකූලව වූ පැමිණිලි හෝ චෝදනා හෝ වාර්තා සම්බන්ධයෙන් විමර්ශන කිරීම, පරීක්ෂණ පැවැත්වීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, කොමිෂන් සභාවේ කාර්යභාරයට පහත සඳහන් කාරණා ඇතුළත් විය යුතු ය:-

(අ) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි, ජීවිත හානි හෝ සිදුව ඇතැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ සත්‍යය, නිවැරදි, අපක්ෂපාතී, පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීම

මගින් ශ්‍රී ලංකාවේ ජනතාව අතර, සත්‍යය පැවසීම, ජාතික සමගිය, සාමය, නීතියේ ආධිපත්‍ය, සහජීවනය, ඉවසීම සමඟ වූ සමානාත්මතාව හා විවිධත්වයට ගරු කිරීම සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම;

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි, ජීවිත හානි හෝ සිදුව ඇතැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සඳහා මුල් වූ හේතු අනාගතයේ ඇති වීම වළක්වා ගැනීම තහවුරු කරගනු පිණිස ඒවා සම්බන්ධයෙන් හැකි උපරිම මට්ටමට විමර්ශනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) කාන්තාවන්ගේ, ළමයින්ගේ සහ ආබාධ සහිත තැනැත්තන්ගේ අත්දැකීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අගතියට පත් තැනැත්තන්හට, (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි, ජීවිත හානි හෝ සිදුව ඇතැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ වාර්තාවක් ලබා දීමට අවස්ථාව සැලසීම මගින් ඔවුන්ගේ අභිමානය යළි ගොඩනැංවීම පිණිස උපකාර කිරීම;

(ඈ) ධනාත්මක අත්දැකීම් ඇතුළුව සත්‍යය ප්‍රකාශ කිරීම සඳහා සහ ස්වකීය විස්තර ප්‍රකාශ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ජනතාවට වේදිකාවක් සහ අවස්ථාවක් ලබා දීම සහ අවශ්‍ය ආරක්ෂාව ඔවුන් වෙත ලබා දීම;

(ඉ) හානිපූරණය සඳහා වන කාර්යාලය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය සහ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය වෙත කරුණු යොමු කිරීම ඇතුළුව අගතියට පත් තැනැත්තන් සඳහා ඵලදායී පිළියම් ලබා දීමේ මාර්ග සහ ආකාර සහ ඔවුන් සම්බන්ධ විවිධ හානිපූරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම;

(ඊ) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි, ජීවිත හානි හෝ සිදුව ඇතැයි කියනු ලබන මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය වීම වළක්වා ගැනීම පිණිස සහ ඒවා නැවත සිදු නොවීම තහවුරු කිරීම පිණිස සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම පිණිස ගත යුතු හෝ හඳුන්වා දෙනු ලැබිය යුතු ආයතනික, පරිපාලන සහ ව්‍යවස්ථාදායක ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සහ සම්පත් වෙන් කිරීමේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම;

(උ) (i) අගතියට පත් තැනැත්තන්ගේ ධනාත්මක අත්දැකීම් සහ (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව අතයි කියනු ලබන අලාභ හෝ හානි, ජීවිත හානි හෝ සිදුව ඇතැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම නැවත සිදු වීම වැළැක්වීම උදෙසා ඒවා භාවිත කිරීමේ හැකියාව වාර්තා කිරීම්;

(ii) ප්‍රතිසන්ධානය, විවිධ ප්‍රජාවන් අතර සහජීවනය, යහපාලනය, යුක්තිය, නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම සහ දඬුවම් නොලැබීමට එරෙහිව සටන් කිරීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳ නිර්දේශ ඇතුළු (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි, ජීවිත හානි හෝ සිදුව ඇතැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම අනාගතයේ සිදු වීම වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳ පොදු නිර්දේශ; සහ

(iii) ආර්ථික සහ සමාජයීය අයිතිවාසිකම් ඇතුළු මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ විමර්ශන සහ නිර්දේශ සහ එකී ගැටළු විසඳනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම්,

ඇතුළුව කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්, විමර්ශන සහ නිර්දේශ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සපයමින් වාර්තාවක් සම්පාදනය කිරීම;

(ඌ) (i) අත්තනෝමතික ලෙස මිනිස් ජීවිත අහිමි කිරීමට හේතුවන ක්‍රියා හෝ නොකර හැරීම් හෝ ඒ සඳහා කරන ලද යම් තැත් කිරීම්, අධිකරණබාහ්‍ය ඝාතන, ඝාතන සහ සමූල ඝාතන;

(ii) වධදීමේ, කෲර, අමානුෂික සහ නින්දිත ලෙස සැලකීමේ ක්‍රියා;

(iii) කාන්තාවන්ගේ, දරුවන්ගේ, ආබාධ සහිත තැනැත්තන්ගේ, රැඳවියන්ගේ සහ සිරකරුවන්ගේ විශේෂ අත්දැකීම් කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් ලිංගික හිංසනය, තැනැත්තන් අපයෝජනය කිරීම සහ සූරා කෑම;

(iv) පැහැර ගැනීම, ප්‍රාණ ඇපකරුවන් ලෙස ගැනීම, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම;

(v) අත්තනෝමතික ලෙස හෝ නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම;

(vi) ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා සාමාජිකයින්, පොලිසියේ සාමාජිකයන් සහ සිවිල් ආරක්ෂක නිලධරයන් ඇතුළුව පුද්ගලයන්ගේ ජීවිත හානි වීම හෝ ජීවිත හානි වීමේ බරපතළ අවදානම සඳහා දායක වූ උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ ගැටුමට අදාළව සිදුව ඇතැයි කියනු ලබන දූෂණ සහ උපකරණ සහ මූල්‍ය සම්පත් චේතනාන්විතව ම අවභාවිතා කිරීම සම්බන්ධයෙන් කරුණු සෙවීම;

(vii) උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇති වූ ගැටුම හෝ එහි පසු විපාක වශයෙන් එම ගැටුම හා සම්බන්ධ සන්නද්ධ කණ්ඩායම්වලට ළමුන් බඳවා ගැනීමේ සිද්ධි සම්බන්ධයෙන් කරුණු සෙවීම;

(viii) ශ්‍රී ලංකාව තුළ තැනැත්තන් හෝ ජනගහනය බලහත්කාරයෙන් මාරු කිරීම හෝ අවතැන් කිරීමේ චෝදනා සම්බන්ධයෙන් කරුණු සෙවීම;

(ix) තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් දේපළ අත්තනෝමතික ලෙස හෝ නීති විරෝධී ලෙස අහිමි කිරීමේ චෝදනා සම්බන්ධ කරුණු සෙවීම;

(x) ආගම, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී-පුරුෂභාවය, උපන් ස්ථානය, දේශපාලන මතය, භාෂාව හෝ කුලය මත පදනම්ව වෙනස් කොට සැලකීමට හෝ පුද්ගල අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට තුඩු දී ඇති භාවිතයන් වේ නම් ඒවා පැවතීම පිළිබඳව කරුණු සොයා බැලීම;

(xi) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති, සිදුව ඇතැයි කියනු ලබන යම් උල්ලංඝනය කිරීම් සහ හිරිහැර කිරීම්, ක්‍රමානුකූල අපරාධවල කොටසක් වශයෙන් සිදු කරනු ලැබ ඇති දැයි කරුණු සොයා බැලීම; සහ

(xii) (1) වන උපවගන්තියේ සඳහන්, සිදුව ඇතැයි කියනු ලබන උල්ලංඝනය කිරීම් සහ හිරිහැර කිරීම් සඳහා උපදෙස් ලබා දෙන ලද, සැලසුම් කරන ලද, විධාන කරන ලද, අණ ලබා දෙන ලද හෝ නියෝග කරන ලද තැනැත්තන් ඇතුළුව එම දාමරික ක්‍රියා සිදු කිරීම සඳහා වගකිව යුතු තැනැත්තන් සම්බන්ධව කරුණු සොයා බැලීම,

ඇතුළුව (1) වන උපවගන්තියේ දක්වා ඇති තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි හෝ ජීවිත හානි හෝ සිදුව ඇතැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම;

(එ) සාමය ගොඩනැගීම සහ ගැටුම් පරිවර්තනය කිරීම සහ සුදුසුකම්ලත් තැනැත්තන් මගින් ජීවනෝපාය පුහුණු අවස්ථා සැපයීම මගින් බලපෑමට ලක් වූ ප්‍රජාවන් සවිබල ගැන්වීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඒ) (i) (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි හෝ ජීවිත හානි හෝ සිදුව ඇතැයි කියනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම;

(ii) ශ්‍රී ලංකාවේ විවිධ ජනවාර්ගික හෝ ආගමික කණ්ඩායම් අතර යම් ගැටුමක් ඇති වීම,

නැවත සිදු වීම වැළැක්වීම සම්බන්ධයෙන් සහ ඒ සඳහා මුල් වූ හේතු සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඔ) මේ පනතේ අරමුණ සහ ලබා ගත හැකි පිළිසරණ පිළිබඳව මහජනතාව අතර ඇති දැනුවත්භාවය ඇති කිරීම; සහ

(ඕ) කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම්, විමර්ශන, ක්‍රියාත්මක කිරීම් සහ නිර්දේශ පිළිබඳ සම්පූර්ණ වාර්තා සම්පාදනය කිරීම.

**III** වන කොටස

## කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**13.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින්, එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන යම් බලතලයක් හෝ සියලු බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය:- කොමිෂන් සභාවේ බලතල

(අ) එහි ව්‍යුහය සහ පරිපාලන විධිවිධාන විශේෂිතව ම දක්වමින්, කොමිෂන් සභාව සඳහා ම වූ අභ්‍යන්තර නියෝග, කාර්ය පටිපාටි සහ මාර්ගෝපදේශ සූදානම් කිරීම;

(ආ) කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සියලු ම කාර්ය මණ්ඩලය විසින්

අනුගමනය කළ යුතු ස්ත්‍රී-පුරුෂභාව සම්බන්ධයෙන් සංවේදී ප්‍රතිපත්ති සැකසීම ඇතුළුව මාර්ගෝපදේශ හෝ අතුරු නීති සෑදීම;

(ඇ) ස්ත්‍රී-පුරුෂභාවය ඇතුළුව ශ්‍රී ලංකාවේ බහුත්ත්ව ස්වභාවය පිළිබිඹු කරනු ලබන සංයුතියකින් යුත් කාර්ය මණ්ඩලයක් පත් කිරීම සහ කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාළව ඔවුන්ට පුහුණු පහසුකම් සැපයීම. කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවට රාජ්‍ය නිලධරයන් පත් කිරීම සඳහා ඉල්ලීම් කරනු ලැබිය හැකි ය;

(ඈ) සාධාරණ හේතුවක් සඳහා කාර්යමණ්ඩලය සේවයෙන් ඉවත් කිරීම;

(ඉ) කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා මේ පනතේ විශේෂිතව ම සඳහන් වී ඇති ඒකක සහ අංශවලට අමතරව කමිටු, ඒකක හෝ අංශ පිහිටුවීම;

(ඊ) කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන එකී කමිටු, ඒකක, අංශ හෝ පුද්ගලයන් වෙත සුදුසු සහ අවශ්‍ය පරිදි බලතල පැවරීම;

(උ) කොමිෂන් සභාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, හානිපූරණය සඳහා වන කාර්යාලය, ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ඇතුළු යම් තැනැත්තකු හෝ අස්තිත්වයක් සමඟ ගිවිසුම්වලට එළඹීම;

(ඌ) යම් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ඇතුළුව, ඒවාට සීමා නොවී කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අරමුදල් රැස්කිරීම:

එසේ වුව ද, ශ්‍රී ලංකාවෙන් බැහැර සිට ලැබෙන සියලු අරමුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබාගත යුතු ය;

(එ) බැංකු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම;

(ඒ) කොමිෂන් සභාවේ වත්කම් පාලනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පරිපාලනය කිරීම;

(ඔ) කොමිෂන් සභාවේ වැඩකටයුතු වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව සඳහා යම් තැනැත්තකුගෙන් හෝ ආයතනයකින් හෝ සංවිධානයකින් තාක්ෂණික සහාය ලබා ගැනීම;

(ඕ) පෙර වූ විමර්ශන කොමිෂන් සභා ඇතුළුව වෙනත් ආයතනවල වැඩකටයුතු උකහා ගැනීම;

(ක) මේ පනතේ සන්දර්භය ඇතුළත ජාතික ප්‍රතිසන්ධානය, සාමය, සහජීවනය සහ නැවත ඇති නොවීම, ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව වැඩකටයුතු ප්‍රමුඛතාකරණය කිරීම;

(ග) 7 වන වගන්තියේ (3) වන උපවගන්තියට යටත් ව, ප්‍රසිද්ධියේ රැස්වීම් වාර පැවැත්වීම සහ කොමිෂන් සභාව විසින් හැකි බවට සලකන විට, එහි කටයුතු සමගාමීව හෝ අන්‍යාකාරයෙන් ප්‍රසිද්ධියේ ගුවන්විදුලි විකාශනය හෝ රූපවාහිනී විකාශනය කිරීම;

(ච) 7 වන වගන්තියේ (4) වන උපවගන්තියට යටත්ව, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, සංවෘත රැස්වීම් වාර පැවැත්වීම;

(ජ) පරිපූර්ණ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සහ කොමිෂන් සභාව විසින් එක් රැස් කරන ලද සියලු කරුණු සහ වාර්තා එකී දත්ත පද්ධතියේ තැන්පත් කරන බව සහ එහි පවත්වාගෙන යන බවට සහතික වීම සහ පවත්වාගෙන යාම සඳහා පියවර ගැනීම සහ ඉන් අනතුරුව ඒවා ලේඛනාරක්ෂණය කිරීමේ කාර්යය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම;

(ඩ) යම් අගතියට පත් තැනැත්තන්ගෙන්, 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානිවලට අදාළ පැමිණිලි හෝ වාර්තා භාර ගැනීම;

(ට) සිය මෙහෙයවීමෙන් ම හෝ අගතියට පත් තැනැත්තකු හෝ තැනැත්තන්ගේ කණ්ඩායමක් හෝ අගතියට පත් තැනැත්තා හෝ තැනැත්තන්ගේ කණ්ඩායමක් වෙනුවෙන් පෙනී සිටින තැනැත්තකු විසින් කොමිෂන් සභාව වෙත සිදු කරනු ලබන පැමිණිල්ලක් මත, 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි හෝ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කිරීම;

(ණ) ආණ්ඩුවේ බලධාරීන්ගෙන් හෝ යම් මූලාශ්‍රයකින් වාර්තා, විස්තර, ලේඛන හෝ තොරතුරු ඉල්ලීම ඇතුළුව කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීමේ දී අදාළ වන බවට කොමිෂන් සභාව විසින් සලකනු ලබන යම් තොරතුරු රැස් කිරීම සහ ලේඛනාගාරගත තොරතුරු සහ වර්ගීකරණය කරන ලද ලේඛනවලට ප්‍රවේශ වීම ඇතුළු ව අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථාවක දී එම තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා බල කිරීම;

(ත) ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින යම් තැනැත්තකු සතුව ඇති තොරතුරු සැපයීම සඳහා හෝ ලේඛනයක් හෝ එකී තැනැත්තා සතුව ඇති වෙනත් යමක් ඉදිරිපත් කිරීම සඳහා සභාවේ යම් රැස්වීමකට හෝ විභාගයකට සහභාගී වීම සඳහා එකී තැනැත්තා කැඳවීම;

(ද) ලිඛිත හෝ වාචික සියලු තොරතුරු ලබා ගැනීම හෝ භාර ගැනීම සහ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන සියලු තැනැත්තන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හෝ එකී තැනැත්තන් සතුව ඇති යම් ලේඛනයක් හෝ වෙනත් යමක් ඉදිරිපත් කිරීමට ඔවුන්ට නියම කිරීම;

(න) යම් සාක්ෂිකරුවකුගේ (ලිඛිත හෝ වාචික) සාක්ෂි දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත ලබා දෙන මෙන් නියම කිරීම සහ කොමිෂන් සභාව විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධරයකු මගින් එවැනි සෑම සාක්ෂිකරුවකුට ම දිවුරුම් දීමක් හෝ ප්‍රතිඥාවක් ලබා දීම හෝ ලබා දීමට සැලැස්වීම;

(ප) කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා යම් රජයේ, ආණ්ඩුවේ, පළාත් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ නියෝජිත ආයතනයකින් හෝ එහි යම් නිලධරයකුගෙන් අවශ්‍ය සහාය ඉල්ලා සිටීම. වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් සහාය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලබන එවැනි යම් අධිකාරියක්, නියෝජිත ආයතනයක් හෝ නිලධරයකු විසින් වහාම එම සහාය ලබා දිය යුතු ය. එකී සහායට එකී අධිකාරිය, නියෝජිත ආයතනය හෝ නිලධරයා සන්තකයේ හෝ භාරයේ ඇති තොරතුරු, ලේඛන හෝ වෙනත් යමක් සැපයීම හෝ කොමිෂන් සභාව විසින් යා යුතු බවට නිශ්චය කරන ස්ථාන වෙත ප්‍රවේශ වීම ඇතුළත් වන නමුත්, මේ කාරණාවලට සීමා නොවිය යුතු ය;

(බ) කොමිෂන් සභාවේ මතය අනුව, තොරතුරු අනාවරණය කිරීම යම් තැනැත්තකුගේ ජීවිතයට හෝ ආරක්ෂාවට අවදානමක් හෝ තර්ජනයක් විය හැකි අවස්ථාවල දී, සත්‍යය සොයා ගැනීම අත්‍යවශ්‍ය වන අවස්ථාවක දී සහ විශේෂ අවස්ථාවක් යටතේ පමණක් යම් තැනැත්තකුගෙන් රහසිගතව තොරතුරු ලබා ගැනීම:

එසේ වුව ද, කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, නිලධරයකු ම, සේවකයකු ම හෝ උපදේශකවරයකු ම මේ පනත යටතේ රාජකාරී වගකීම් ඉටු කිරීමේ දී හැර, එකී තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සහ ආරක්ෂා කිරීමට සහාය දැක්වීම කළ යුතු ය:

එසේ ම, තවදුරටත්, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ මතය අනුව, තොරතුරු අනාවරණය කිරීමෙන් යම් තැනැත්තකුගේ ජීවිතයට හෝ ආරක්ෂාවට අවදානමක් හෝ තර්ජනයක්

වන අවස්ථාවක දී, කොමිෂන් සභාව වෙත රහසිගතව තොරතුරු සපයනු ලබන යම් තැනැත්තකුගේ අනන්‍යතාවය හෝ එකී තැනැත්තාගේ අනන්‍යතාවය හෙළි විය හැකි යම් තොරතුරු කොටසක් අනාවරණය කිරීම සඳහා කොමිෂන් සභාවට බල කරනු නොලැබිය යුතු ය;

(ම) (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සත්‍යය සොයාගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ආවේශ්‍ය කළ නොහැකි යම් ලිඛිත හෝ වාචික තොරතුරක් පිළිගැනීම;

(ය) කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විමර්ශනයකට අදාළ තොරතුරු ඇති බවට සැක කරනු ලබන යම් පරිශ්‍රයන් පරීක්ෂා කිරීමට පොලීසියට හැකිවන පරිදි සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම. එකී අවස්ථාවල දී, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය;

(යඅ) මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරන ලද සෝදිසි වරෙන්තුවක අධිකාරිය යටතේ හඳුනාගත් පරිශ්‍ර සෝදිසි කිරීම හා පරීක්ෂා කිරීම සහ කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන යම් විමර්ශනයක් සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් ද්‍රව්‍යයක් පරීක්ෂා කිරීම, එහි පිටපත් ලබා ගැනීම, එහි උද්ධෘත ලබා ගැනීම, එය තහනම් කිරීම සහ රඳවා තබාගැනීම සහ වධ හිංසා පැමිණවීමේ හෝ නීතිවිරෝධී රඳවා තබාගැනීමේ ස්ථාන සඳහා භාවිත කර ඇතැයි කියනු ලැබිය හැකි එවැනි යම් ස්ථානයක් සොයාගෙන සංරක්ෂණය කර ඇති බවට තහවුරු කිරීම. එකී අවස්ථාවල දී, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය;

(යආ) කොමිෂන් සභාවේ විමර්ශන ඉදිරියට ගෙන යැම සඳහා අවශ්‍ය පරිදි ශ්‍රී ලංකා පොලීසියේ සහාය පැතීම;

(යඇ) සැක සහිත මිනීවළවල් හෝ සමූහ මිනීවළවල් සහිත පරිශ්‍ර කැනීම සඳහා සහ එකී කැනීම් කටයුතුවල දී හෝ මෘත දේහ ගොඩ ගැනීමේ දී නිරීක්ෂකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම. එකී අවස්ථාවල දී, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය;

(යඈ) මෙහි (ම) ඡේදයේ විධිවිධානවලට යටත් ව, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය, (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනත, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනත හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් නීතියක් යටතේ දඬුවම් ලබා දිය හැකි වරදක් හෝ වරදවල් සිදුකර ඇති බවට කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක දී, වැඩිදුර විමර්ශනය සහ අවශ්‍ය පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ හෝ නඩු පැවරීමේ අධිකාරීන් වෙත ඒ කාරණා යොමු කිරීම;

(යඉ) 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත ප්‍රකාරව, විදේශයන්හි ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා විදේශ රාජ්‍යන්හි බලධරයන්ගෙන් සහාය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් සහාය ලබා ගැනීම;

(යඊ) කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි, එහි ප්‍රසිද්ධ රැස්වීම් වාර සඳහා පහසුකම් සැලසීමට සහ ප්‍රතිසන්ධානය සහ නැවත සිදුවීම වැළැක්වීමට සහාය වීමෙහි ලා ප්‍රාදේශීය ගැටුම් නිරාකරණය කිරීමට ප්‍රජා නායකයන්ගේ සහ සංවිධානවල සහාය ලබා ගැනීම; සහ

(යඨ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාවේ අරමුණු සහ කාර්යභාරය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු දෑ කිරීම.

සියලුම තැනැත්තන් කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් යුතුව කටයුතු කරනු ලැබිය යුතු බව

**14.** ආණ්ඩුවේ සාමාජිකයන්, රජයේ නිලධරයන් සහ බලධාරීන් ඇතුළු සියලු ම තැනැත්තන් විසින්, මේ පනත යටතේ කොමිෂන් සභාවේ අරමුණු සහ කාර්යභාරය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව සහ එහි කාර්ය මණ්ඩලය සමඟ සහයෝගයෙන් යුතු ව කටයුතු කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## කොමිෂන් සභාවේ වාර්තා සහ නිර්දේශ

කොමිෂන් සභාවේ වාර්තා

**15.** (1) කොමිෂන් සභාව විසින්, 9 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව එහි ධුර කාලය ඉකුත් වන දිනයට වඩා පසු නොවන දිනයක දී එහි නිර්දේශ ඇතුළත් කරමින් එහි ක්‍රියාකාරකම් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් අන්තර්ගත අවසන් වාර්තාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, එහි අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට පෙරාතුව දීර්ඝ විමර්ශන කාලසීමාවකින් අනතුරුව කොමිෂන් සභාවේ කටයුතු විස්තර කරමින්, අතුරු වාර්තා සමඟ නිර්දේශ අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එකී අතුරු වාර්තා ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා වෙත (1) වන සහ (2) වන උපවගන්ති යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අවසන් වාර්තාව සහ එකී අතුරු වාර්තා ඉදිරිපත් කරනු ලැබීමෙන් ඉක්බිතිව ම, කොමිෂන් සභාව විසින්, ජාතික ආරක්ෂාවට බලපෑමක් ඇති කළ හැකි යම් තොරතුරක් රඳවා ගැනීම සඳහා වූ බලයට අගතියකින් තොරව, එකී සියලු වාර්තා සමාජ මාධ්‍ය ද ඇතුළු ව මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය භාවිතයෙන් පළ කරනු ලැබිය යුතු අතර, ඒ වාර්තාවල හෝ ඒවායෙහි සාරාංශවල පිටපත් සකසා, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින්

මහජනයා වෙත ලබා දීමට කටයුතු කිරීම සිදු කරනු ලැබිය යුතු ය. කොමිෂන් සභාව විසින්, මාධ්‍යවල මැදිහත්වීම ද ඇතුළු ව සිය නිර්දේශ සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබා දීමට වගබලාගත යුතු ය.

(4) කොමිෂන් සභාවේ අවසන් වාර්තාවට -

(අ) 12 වන වගන්තියේ විස්තර කරන ලද තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි හෝ ජීවිත හානිවලට මුල් වූ හේතු;

(ආ) 12 වන වගන්තියේ විස්තර කරන ලද තැනැත්තන්ට හෝ දේපළවලට සිදුව ඇතැයි කියනු ලබන අලාභ හෝ හානි හෝ ජීවිත හානි පිළිබඳ කොමිෂන් සභාවේ නිරීක්ෂණ;

(ඇ) කාන්තාවන්ට සහ ළමුන්ට අදාළ ගැටළු වෙත යොමු වෙමින් ඊට අදාළ නිර්දේශ;

(ඈ) ළමා සොල්දාදුවන්, සහ ඔවුන් යථා තත්ත්වයට පත් කිරීම සහ නැවත සමාජගත කිරීම පිළිබඳ නිරීක්ෂණය සහ නිර්දේශ;

(ඉ) ශ්‍රී ලංකාව තුළ තැනැත්තන්ගෙන් හෝ තැනැත්තන් කණ්ඩායම් බලහත්කාරයෙන් අවතැන් කරවීමට අදාළ නිර්දේශ;

(ඊ) වෙනත් දේ අතර, නැවත සිදු නොවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන විශේෂයෙන් ම අධ්‍යාපනික, සෞඛ්‍ය, සංස්කෘතික, පරිපාලන හා ආයතනික ප්‍රතිසංස්කරණ ඇතුළත් නෛතික, දේශපාලනික, සමාජ-ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා වූ නිර්දේශ; සහ

(උ) ප්‍රමුඛතා හඳුනාගනිමින්, මනෝ-සමාජයීය සහාය ඇතුළු හානිපූරණය පිළිබඳ නිර්දේශ,

ඇතුළත් විය යුතු ය.

(5) (1) වන සහ (2) වන උපවගන්ති ප්‍රකාරව වූ කොමිෂන් සභාවේ අතුරු වාර්තාවක හෝ අවසන් වාර්තාවේ දිනයේ සිට දින විසි එකක් ඇතුළත, ජනාධිපතිවරයා විසින් එකී වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ නිර්දේශ

**16.** (1) කොමිෂන් සභාවේ නිර්දේශය යම් තැනැත්තකු සිවිල් හෝ අපරාධ වගකීම නිශ්චය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව විසින් අවස්ථාවෝචිත පරිදි විමර්ශනයක් හෝ පරීක්ෂණයක් හෝ ඒ දෙක ම සිදු කිරීමේ දී රැස් කරගත් කරුණු මත පදනම් වූ යම් වරදක් සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින්, නම් කරන ලද අධිකරණයක දී අපරාධ නඩු කටයුතු පැවරීම නීත්‍යානුකූල විය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද සහ පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද කොමිෂන් සභාවේ අතුරු වාර්තාවල හෝ අවසන් වාර්තාවේ අන්තර්ගත කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාවේ මූල මණ්ඩලයක නිර්දේශ පිළිබඳව පාර්ලිමේන්තුව විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකි අතර, ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය යයි සලකනු ලබන යම් යෝජනාවක් සම්මත කරගනු ලැබිය හැකි ය.

V වන කොටස

**අගතියට පත් තැනැත්තන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

අගතියට පත් තැනැත්තන් සහ සාක්ෂිකරුවන් සඳහා ආරක්ෂාව

**17.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් අගතියට පත් තැනැත්තන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතු ය.

හානිපූරණය

**18.** (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වී කටයුතු කළ සහ කොමිෂන් සභාවේ අදහස අනුව හානිපූරණය සඳහා හිමිකම් කියනු ලබන අගතියට පත් තැනැත්තන් සහ සාක්ෂිකරුවන් වෙත, ප්‍රතිෂ්ඨාපනය, මූල්‍යමය වන්දි ගෙවීම, සුබසාධන සේවා සහ පුනරුත්ථාපනය ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවූ ද්‍රව්‍යමය හෝ සංකේතාත්මක හානිපූරණ ප්‍රදානය කිරීම නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, ප්‍රතිසන්ධානය සහ නැවත සිදු නොවීම උදෙසා පහසුකම් සැපයීම සඳහා සාමූහික හානිපූරණය නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින් සිය නිර්දේශයන්, හානිපූරණය සඳහා වන කාර්යාලය සහ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය ඇතුළු සුදුසු අධිකාරීන් වෙත යොමු කරනු ලැබිය හැකි ය.

වෛද්‍ය සහ මනෝ සමාජයීය සහාය

**19.** කොමිෂන් සභාවේ මතය අනුව, අගතියට පත්වූවන් හා සාක්ෂිකරුවන් සඳහා වෛද්‍ය සහ මනෝ සමාජයීය සහාය වැනි සේවා අවශ්‍ය කරනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ කටයුතු අතරතුර -

(අ) අගතියට පත් තැනැත්තන්ව සහ සාක්ෂිකරුවන්ව කාර්යක්ෂම ලෙස හැසිරවීමට හැකිවනු පිණිස සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මනෝ සමාජයීය පුහුණුවක් ලබා දීම;

(ආ) පීඩාවට පත් තැනැත්තන් සහ සාක්ෂිකරුවන් සමග වන ප්‍රසිද්ධ හෝ සංවෘත රැස්වීම් වාරවල දී, ස්ථානීය මනෝ සමාජයීය උපදේශකවරුන් ලබා දීම; සහ

(ඇ) පීඩාවට පත් තැනැත්තන් මානසික වශයෙන් සූදානම්ව සිටින බව තහවුරු කිරීම සඳහා ප්‍රසිද්ධ හෝ සංවෘත රැස්වීම් වාරවලට පෙරාතුව, විශේෂයෙන් ළමුන්ගේ, කාන්තාවන්ගේ සහ ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා වෙත යොමු වෙමින්, අවශ්‍ය පරිදි, අගතියට පත් තැනැත්තන් සහ සාක්ෂිකරුවන් සඳහා මනෝ සමාජයීය උපදෙස් සහ පසු විමසීම් හෝ ඇගයීම් පැවැත්වීම,

ඇතුළුව වෛද්‍ය හා මනෝ සමාජයීය සහාය ලබා දීම සඳහා ප්‍රමුඛතාවය ලබා දීම සහ පහසුකම් සැලසීම සිදු කරනු ලැබිය යුතු ය.

ආරක්ෂක පියවර

**20.** (1) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ මතය අනුව ආරක්ෂක පියවර අවශ්‍ය වන අගතියට පත් තැනැත්තන් සහ සාක්ෂිකරුවන්ගේ අනන්‍යතාව ආරක්ෂා කිරීම හෝ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, විශේෂයෙන් ම, ළමුන්ගේ ප්‍රකාශ සංවෘත රැස්වීම් වාරවල දී ලබාගන්නා බවට සහ ළමුන්ගේ අනන්‍යතාවය හෙළිවීමට තුඩුදිය හැකි තොරතුරු පොදු පිටපත්වලින් සංස්කරණය කොට පිළියෙල කිරීම සිදු කරන බවට සහ ඔවුන්ගේ රහස්‍යභාවය නිසි ලෙස ආරක්ෂා කරනු ලබන බවට තහවුරු කරනු ලැබිය යුතු ය.

(3) ළමයකු විසින් හෝ ඔහුගේ හෝ ඇයගේ භාරකරු විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත කොමිෂන් සභාව විසින්, ඔහුගේ හෝ ඇයගේ ප්‍රකාශය වීඩියෝ පටිගත කිරීමක් හරහා ඉදිරිපත් කිරීමට හෝ කොමිෂන් සභාව ඉදිරියේ පෞද්ගලිකව ම පෙනී සිටීම වෙනුවට ශ්‍රව්‍ය-දෘශ්‍ය සබැඳියක් හරහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම යන විකල්ප දෙක අතුරින් එක් විකල්පයක් සඳහා ඉඩ ලබාදීම කරනු ලැබිය යුතු ය.

පීඩාවට පත් තැනැත්තන් සහ සාක්ෂිකරුවන් සඳහා ප්‍රවේශය

**21.** කොමිෂන් සභාව විසින්, කාන්තාවන්, ළමුන් සහ ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා වෙත විශේෂයෙන් යොමු වෙමින්, අගතියට පත් තැනැත්තන්ට සහ සාක්ෂිකරුවන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානවල දී සහ පහසු ආකාරයෙන් කොමිෂන් සභාවේ රැස්වීම් වාර පැවැත්වීමට හැකිතාක් උත්සාහ කළ යුතු ය.

සාක්ෂිකරුවන්ගේ ගමන් සඳහා අරමුදල් ලබාදීම

**22.** කොමිෂන් සභාවේ අභිමතය පරිදි, කොමිෂන් සභාව විසින් කැඳවනු ලබන තැනැත්තන්ගේ ගමන් සඳහා කොමිෂන් සභාව විසින් අරමුදල් සපයනු ලැබිය හැකි ය.

ජනතාවගේ අයිතිවාසිකම් සහ ඔවුන්ගේ තොරතුරුවල විභව්‍ය භාවිතය පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමේ කාර්යය

**23.** කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාව වෙත තොරතුරු සපයනු ලබන අගතියට පත් තැනැත්තන්ව, සාක්ෂිකරුවන්ව සහ වෙනත් තැනැත්තන්ව, ඔවුන් විසින් සපයන ලද යම් තොරතුරක් භාවිත කිරීමේ හැකියාව පිළිබඳව සහ අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ හෝ නඩු පැවරීමේ ශ්‍රී ලංකාවේ බලධාරීන් වෙත බරපතල අපරාධ වාර්තා කිරීම සඳහා ඔවුන් සතු අයිතිය ඇතුළුව අදාළ බලධාරීන් වෙත සෘජුව ම කාරණා යොමු කිරීමට ඔවුන් සතු අයිතිය පිළිබඳව සහ පරිපාලන සහනය සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් යාන්ත්‍රණ තිබේ ද යන්න පිළිබඳව දැනුවත් කළ යුතු ය.

වෙනස්කම්වලින් තොරව අගතියට පත් තැනැත්තන්ගේ සහ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමේ වගකීම

**24.** මේ පනත යටතේ එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කොමිෂන් සභාව විසින්, අගතියට පත් තැනැත්තන්ගේ, සාක්ෂිකරුවන්ගේ සහ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්, තරාතිරම නොසලකා සහ කුමන හෝ හේතුවක් මත වෙනස්කම් වලට පාත්‍ර කිරීමකින් තොරව සමානාත්මතාවය මත පදනම්ව තහවුරු කරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## ලේකම් කාර්යාලය සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා

ලේකම් කාර්යාලය

**25.** කොමිෂන් සභාවට, කොමිෂන් සභාවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් වගකීම භාරව සිටිය යුතු ලේකම් කාර්යාලයක් තිබිය යුතු ය. ලේකම් කාර්යාලයට වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය සහ දත්ත කළමනාකරණ අංශය සහ කොමිෂන් සභාව විසින් අවශය යයි සලකනු ලැබිය හැකි වෙනත් අංශ ඇතුළත් විය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා

**26.** (1) ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාව විමසා, ලේකම් කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු සහ කොමිෂන් සභාවේ අධිකාරයට යටත් විය යුතු සහ කොමිෂන් සභාව වෙත වාර්තා කරනු ලැබිය යුතු සුදුසු අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සහිත තැනැත්තකු කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාව විමසා, සාධාරණ හේතුවක් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පහත සඳහන් කර්තව්‍ය ඇතුළුව, එහෙත් ඊට සීමා නොවී, කොමිෂන් සභාවේ කාර්ය සහ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම පිළිබඳ වගකියනු ලැබිය යුතු ය:-

(අ) කොමිෂන් සභාවේ එදිනෙදා කාර්ය සහ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම;

(ආ) කොමිෂන් සභාවේ සියලු වාර්තා, ලේඛන සහ ද්‍රව්‍ය භාරයේ පවත්වාගෙන යාම සහ සංරක්ෂණය කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ වත්කම් කළමනාකරණය කිරීම; සහ

(ඈ) කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි වෙනත් කාර්ය ඉටු කිරීම.

**සියලුම අංශ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විෂය පථය යටතේ පැවතිය යුතු බව**

**27.** (1) කොමිෂන් සභාව විසින් වෙනත් යම් ආකාරයකින් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, ලේකම් කාර්යාලයේ සියලුම අංශ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විෂය පථය යටතේ තිබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙනත් යම් ආකාරයකින් තීරණය කර කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, එකී අංශවල සියලු ම නිලධරයන් සහ කාර්ය මණ්ඩලය, කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු අතර කොමිෂන් සභාවේ පූර්ණ කාලීන සේවකයන් විය යුතු ය.

(3) එකී සියලු ම නිලධරයන් සහ කාර්ය මණ්ඩලය සාධාරණ හේතුවක් සඳහා පමණක් කොමිෂන් සභාව විසින් ඉවත් කරනු ලැබිය යුතු ය.

(4) එකී අංශවල නිලධරයන් සහ කාර්ය මණ්ඩලය විසින් ස්ත්‍රී-පුරුෂභාවය ද ඇතුළුව ශ්‍රී ලංකාවේ බහුත්ත්ව ස්වභාවය පිළිබිඹු කළ යුතු ය.

**වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය**

**28.** (1) වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ක්‍රමවේදයක් ගොඩනැංවීමට සහ බලාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන් ම මේ පනතේ 17 වන, 18 වන, 19 වන, 20 වන, 21 වන, 22 වන, 23 වන සහ 24 වන වගන්ති යටතේ වන කොමිෂන් සභාවේ කාර්ය සහ වගකීම් ඉටු කිරීමට සහාය විය යුතු වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශයක් තිබිය යුතු ය.

(2) වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය විසින් පුද්ගලික ආරක්ෂාව, මනෝ සමාජයීය සහාය සැපයීම සඳහා සහ කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වන පීඩාවට පත් සියලු ම තැනැත්තන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා පහසුකම් සැපයීම මෙන්ම එම තැනැත්තන් විසින් ඉල්ලා සිටිනු ලබන පරිපාලන සහ සුබසාධන සේවා සැපයීම හෝ ඒ සඳහා පහසුකම් සැපයීම සඳහා උත්සාහ දැරිය යුතු ය.

(3) වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශයට, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය මගින් පූර්ණ සහයෝගය ලබා දිය යුතු ය. කොමිෂන් සභාව, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ කාර්ය සඳහා වන "කොමිෂන් සභාවක්" ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශය, එයට අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, නීතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කරනු ලැබිය යුතු ය.

### දත්ත කළමනාකරණ අංශය

**29.** (1) කොමිෂන් සභාවේ දත්ත සමුදාය නිර්මාණය කිරීම, පවත්වාගෙන යාම සහ කළමනාකරණය කිරීම සඳහා වගකියනු ලැබිය යුතු, දත්ත කළමනාකරණ අංශය තිබිය යුතු ය.

(2) දත්ත කළමනාකරණ අංශය විසින් එහි සියලු දත්ත සමුදායන් සහ දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා, අදාළ නීති සමග අනුකූල වන තාක්ෂණික පියවර ඇතුළු අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු අතර කරුණු අධිලේඛනගත කිරීම, වාර්තා සංරක්ෂණය කිරීම සහ දත්ත සමුදාය සහ ආයතනික මතකය පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවරයන් ගනු ලැබිය යුතු ය. දත්ත කළමනාකරණ අංශය විසින් සෑම විට ම එකී පදනම මත රැස්කරගත් තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සහතික කළ යුතු ය.

### විශේෂිත යාන්ත්‍රණ සහ උපදේශකවරුන්

**30.** ඉහත නම් කරන ලද අංශවලට අමතරව, කොමිෂන් සභාවට සුදුසු යයි හැඟෙන පරිදි, නිශ්චිත ක්ෂේත්‍ර, විෂයයන් හෝ ගැටළු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් ලබාදීම සඳහා අවශ්‍ය විශේෂඥතා සහිත උපදේශකවරුන් මෙන් ම, කාන්තාවන්ගේ, ළමුන්ගේ, ආබාධ සහිත තැනැත්තන්ගේ සහ අවාසිදායක තත්ත්වයට පත් කණ්ඩායම්වල අත්දැකීම් සහ නිශ්චිත අවශ්‍යතා වෙත යොමු වීම සඳහා නිශ්චිත යාන්ත්‍රණ සහ කාර්ය පටිපාටි පත් කිරීම හෝ පිහිටුවීම සිදු කළ හැකි ය.

කොමිෂන් සභාව විසින් විධාන නිකුත් කරනු ලැබිය හැකි බව

**31.** කොමිෂන් සභාව විසින්, සුදුසු යයි හැඟෙන පරිදි, කොමිෂන් සභාවේ අංශ සහ ඒකක වෙත විධාන සහ උපදෙස් නිකුත් කිරීම හෝ ඒ අංශ සහ ඒකක වෙතින් සෘජුව ම උපදෙස් ලබා ගැනීම සිදු කළ හැකි ය.

උපදේශක මූල මණ්ඩලය

**32.** (1) උපදේශක මූල මණ්ඩලය වෙත යොමු කරනු ලබන කාරණා පිළිබඳ කොමිෂන් සභාව, කොමිෂන් සභාවේ මූල මණ්ඩල සහ ලේකම් කාර්යාලය වෙත උපදෙස් ලබාදීමේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් උපදේශක මූල මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අවම වශයෙන් දසදෙනෙකුගෙන් උපදේශක මණ්ඩලය සමන්විත විය යුතු ය. උපදේශක මණ්ඩලයට එසේ පත් කරනු ලබන සාමාජිකයන්, පිළිගත් අවංකත්වය, සහකම්පනය, සමාජ තත්ත්වය සහ ගෞරවය සමඟ වූ සත්‍යය, ප්‍රතිසන්ධානය, සමානාත්මතාවය සහ යුක්තිය පිළිබඳ ප්‍රදර්ශනය කරන ලද කැපවීම සහිත තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර, එයට වෙනත් යම් දේශයකින් සුදුසු තැනැත්තන් ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ අතුරු වාර්තා සහ අවසන් වාර්තා කෙටුම්පත් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට පෙරාතුව කොමිෂන් සභාව විසින් සලකා බැලීම සඳහා අදහස් සහ නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස උපදේශක මූල මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) උපදේශක මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවිය යුතු පාරිශ්‍රමික සහ ඔවුන්ගේ සේවය ලබා ගැනීමේ නියම, කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

## මුදල්

කොමිෂන් සභාවට අරමුදල් සැපයීම

**33.** මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති කර්තව්‍ය ඉටු කිරීමට එම කොමිෂන් සභාවට හැකි වන පරිදි, ප්‍රමාණවත් අරමුදල් රජය විසින් ඒ කොමිෂන් සභාව වෙත සපයනු ලැබිය යුතු ය. එකී අරමුදල් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

මූලික ප්‍රාග්ධනය

**34.** කොමිෂන් සභාවේ වැඩ කටයුතු සඳහා අවශ්‍ය කරනු ලබන මූල්‍ය සම්පත්වල මූලික ප්‍රාග්ධනයකින් කොමිෂන් සභාව ආරම්භ කළ යුතු අතර, මූලික ප්‍රාග්ධනයේ එකී මුදල් ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු අතර, මෙහි 35 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබ ඇති අරමුදලට බැර කළ යුතු ය.

කොමිෂන් සභාවේ අරමුදල

**35.** (1) කොමිෂන් සභාවට අරමුදලක් තිබිය යුතු ය. කොමිෂන් සභාවේ අරමුදලට-

(අ) කොමිෂන් සභාවේ මූලික ප්‍රාග්ධනය වශයෙන් ඒකාබද්ධ අරමුදලින් ලැබෙන මුදල්;

(ආ) කොමිෂන් සභාව විසින් එහි කර්තව්‍යයන් ඉටු කිරීමේ දී ලැබිය හැකි සියලු ම මුදල්;

(ඇ) යම් නීත්‍යනුකූල මූලාශ්‍රයක් හරහා පරිත්‍යාග, තෑගි හෝ ප්‍රදාන වශයෙන් කොමිෂන් සභාව වෙත ලැබිය හැකි සියලු ම මුදල්:

එසේ වුව ද, ලංකාවෙන් බැහැරව සිට ලැබුණු එකී අරමුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබා ගත යුතු ය; සහ

(ඈ) 13 වන වගන්තියේ (උ) ඡේදය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් රැස්කරගත් අරමුදල්,

බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**36.** කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ වැටුප් අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබ ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර, ඔවුන්ගේ ධුර කාල තුළ අඩු කරනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ ගිණුම්

**37.** සිය ආදායම සහ වියදම සහ වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් නිසි ගිණුම් තබා ගැනීමට කොමිෂන් සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

වාර්ෂික වාර්තා

**38.** කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ ගිණුම්වල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා සමගාමීව විද්‍යුත් මාධ්‍ය සහ අන්තර්ජාලය හරහා ඇතුළු ව පළ කරනු ලැබ මහජනයා අතර ප්‍රචලිත කරනු ලැබිය යුතු ය.

VIII වන කොටස

**කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

**39.** කොමිෂන් සභාව විසින්, පළමු අතුරු වාර්තාව පළ කරනු ලැබීමෙන් හෝ අතුරු නිර්දේශ ලබා දීමෙන් මසක් ඇතුළත, ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම, නියාමනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) නියාමන කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය. ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විමසා, කමිටුවේ කාලසීමාව නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු අතර එකී කාලසීමාව අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි අලුත් කරනු ලැබිය හැකි ය.

කමිටුවේ සංයුතිය ආදිය

**40.** (1) කමිටුව, ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන-

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වූ සාමාජිකයන් පස් දෙනෙකු:-

(i) මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(ii) අධිකරණ, නීතිය හා සාමය විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(iii) ආරක්ෂක විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(iv) රාජ්‍ය පරිපාලන විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු;

(v) කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු; සහ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත් කරනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු වෙනත් තැනැත්තන් සය දෙනෙකු,

ඇතුළු තැනැත්තන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(2) කමිටුවේ සංයුතිය මගින්, ස්ත්‍රී-පුරුෂ සමබරතාවය සහ ශ්‍රී ලංකාවේ බහුත්ත්ව ස්වභාවය පිළිබිඹු කරනු ලැබිය යුතු අතර, සියලු ම සාමාජිකයන් කොමිෂන් සභාවේ කර්තව්‍ය සිදු කරගෙන යාමට අදාළ දැනුම, ප්‍රායෝගික අත්දැකීම් සහ සුදුසුකම් මත පදනම් ව පත් කරනු ලබන අවංකත්වයෙන් සහ විශ්වසනීයත්වයෙන් යුතු තැනැත්තන් විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද සාමාජිකයන්, වසර තුනක කාලසීමාවක් සඳහා පත් කරනු ලැබිය යුතු අතර, නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයන්ගේ පාරිශ්‍රමික අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(5) 3 වන වගන්තියේ (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන, කමිටුව පත්කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගත යුතු ය.

(6) කමිටුවේ කටයුතු සිදු කරගෙන යාමේ දී, කමිටුව විසින් ආණ්ඩුවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංවිධාන හෝ ඒ අවශ්‍ය යයි සලකනු ලැබෙන පරිදි වෙනත් යම් තැනැත්තකු සමග සම්බන්ධීකරණය කළ යුතු අතර, එකී ආයතන හෝ තැනැත්තා විසින් කමිටුව වෙත අවශ්‍ය සහයෝගය සහ සහාය ලබාදිය යුතු ය.

(7) රජය විසින්, කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ නියාමනය කිරීම සහ ඊට පහසුකම් සැපයීමේ වගකීම සපුරාලීමට අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් කමිටුව වෙත සපයනු ලැබිය යුතු ය.

(8) කමිටුවේ යම් සාමාජිකයකුගේ ධූරය -

(අ) සාධාරණ හේතුවක් මත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කිරීම මත;

(ආ) එකී සාමාජිකයාගේ මිය යාම මත;

(ඇ) එකී සාමාජිකයා විසින් ජනාධිපතිවරයා වෙත ලිඛිතව යවනු ලබන ලිපියක් මගින් දක්වමින් එකී ධූරයෙන් ඉල්ලා අස්වීම මත;

(ඈ) කමිටුවේ නිල කාලය ඉකුත් වීම හේතුවෙන් සාමාජිකයකුගේ ධූර කාලය ඉකුත් වීම මත,

හිස්වනු ලැබිය යුතු ය.

(9) කමිටුව විසින්, ජනාධිපතිවරයා වෙත, කොමිෂන් සභාවේ සහ වෙනත් පෙර පැවති විමර්ශන කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුවේ හෝ ඒ පිළිබඳ සැලකිල්ලක් දක්වන වෙනත් යම් තැනැත්තකුගේ හෝ පුද්ගල මණ්ඩලයක ප්‍රයත්නයන් පිළිබඳ ඇගයීමක්, සෑම මාස හයකට ම වරක්, අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමින් කරනු ලැබිය යුතු අතර, එකී වාර්තාව ලැබීමෙන් සති දෙකකට වඩා පසු නොවන කාලයක් තුළ ජනාධිපතිවරයා විසින්, එම වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතු ය. කමිටුව විසින් එකී වාර්තාවල පිටපත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මහජනතාවට ලබාගත හැකි වන ලෙස සකස් කළ යුතු ය.

(10) යම් නිර්දේශයක් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන් ම සිදු කර නොමැති අවස්ථාවක දී, කමිටුව විසින් එය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු තැනැත්තන් සහ සංවිධාන මගින් සපයන ලද පරිදි, එසේ ක්‍රියාත්මක නොකිරීම සඳහා හේතු ඇතුළත් කරනු ලැබිය යුතු ය.

## IX වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

කොමිෂන් සභාවේ සාමාජිකයන් රජයේ නිලධරයන් වශයෙන් සැලකිය යුතු බව

**41.** කොමිෂන් සභාවේ සාමාජිකයන් (මේ පනත යටතේ එහි කර්තව්‍යවල සීමිත කාර්ය සඳහා) සහ කොමිෂන් සභාවේ නිලධරයන් සහ කාර්ය මණ්ඩලය (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ සහ (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ කාර්ය සඳහා රජයේ නිලධරයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව දූෂණ විරෝධී පනත යටතේ උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

**42.** කොමිෂන් සභාව 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

පුද්ගලික භාවිතය සඳහා තොරතුරු භාවිත කිරීමේ තහනම

**43.** කොමිෂන් සභාවේ කිසිදු සාමාජිකයකු හෝ කොමිෂන් සභාවේ කිසිදු නිලධරයකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු විසින්, එකී සාමාජිකයාගේ කොමිෂන් සභාවේ වැඩ කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් ලබාගත් යම් රහසිගත තොරතුරක්, පුද්ගලික භාවිතය සඳහා යොදා ගැනීම, එයින් ලාභ ඉපැයීම හෝ එකී තොරතුරු කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධරයකු හෝ සාමාජිකයකු ලෙස ඔවුන්ගේ කර්තව්‍ය අතරතුර හැර වෙනත් තැනැත්තකු වෙත හෙළිදරව් කිරීම නොකළ යුතු ය. මෙම වගකීම කොමිෂන් සභාවේ නිල කාලය ඉකුත් වුව ද නොනැසී පැවතිය යුතු ය.

සාමාජිකයන් සහ කාර්ය මණ්ඩලය අපක්ෂපාතී විය යුතු බව

**44.** කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු විසින් ම හෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධරයකු හෝ සාමාජිකයකු විසින් ම අපක්ෂපාතීව සහ සම්බන්ධතා අතර ගැටුමකින් තොරව ක්‍රියා කරනු ලැබිය යුතු ය. ඒ අනුව, එකී සාමාජිකයා, නිලධරයා හෝ කාර්ය මණ්ඩල සාමාජිකයා විසින් පක්ෂග්‍රාහී ස්වරූපයක් ඇති කළ හැකි හෝ කොමිෂන් සභාවේ විශ්වසනීයත්වය යටපත් කරනු ලැබිය හැකි යම් ක්‍රියාවක් නොකළ යුතු ය.

වැරදි

**45.** (1) යම් තැනැත්තකු -

(අ) කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කැඳවීමක් ප්‍රකාරව, හේතුවක් නොමැතිව කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම පැහැර හරින්නේ නම්;

(ආ) හේතුවක් නොමැතිව, කොමිෂන් සභාව විසින් ඔහු වෙත ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්;

(ඇ) හේතුවක් නොමැතිව, කොමිෂන් සභාව විසින් ඔහු වෙත නිකුත් කරනු ලබන හෝ දෙනු ලබන දැන්වීමක හෝ ලිඛිත නියමයක හෝ විධානයක නියමයන්ට අනුකූලව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම්;

(ඈ) කැඳවීමක් භාර දෙනු ලැබ ඇතිවිට, ඔහුගේ සන්තකයේ හෝ පාලනයේ පවතින යම් ලේඛනයක් හෝ වෙනත් යමක් ඉදිරිපත් කිරීම හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ පැහැර හරින්නේ නම්;

(ඉ) මේ පනත යටතේ බලය පවරනු ලැබ ඇති නිලධරයකුට, ඔහු වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරනු ලැබීමේ දී විරෝධය පාන්නේ නම් හෝ බාධා කරන්නේ නම්;

(ඊ) කොමිෂන් සභාවේ බලතල, වගකීම් සහ කාර්ය ඉටු කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාවට සිතා මතා ම හිරිහැර කරන්නේ නම් හෝ ඊට බාධා කරන්නේ නම්;

(උ) කොමිෂන් සභාවේ වැඩ කටයුතුවලට අනිසි ලෙස බලපෑම් කිරීම හෝ මැදිහත් වීම අරමුණු කරගත් යම් ක්‍රියාවක් සිදු කරන්නේ නම්;

(ඌ) කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලබන හෝ සහයෝගයෙන් කටයුතු කිරීමට

අදහස් කරනු ලබන යම් තැනැත්තකුට තර්ජනය කරන්නේ නම්, තැති ගන්වන්නේ නම් හෝ අනිසි ලෙස බලපෑම් කරන්නේ නම් හෝ තර්ජනය කිරීමට, තැති ගැන්වීමට, අනිසි ලෙස බලපෑම් කිරීමට තැත් කරන්නේ නම්;

(එ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් රහසිගත තොරතුරක් හෙළිදරව් කරන්නේ නම්;

(ඒ) හේතුවක් නොමැතිව කොමිෂන් සභාවේ වෙනත් යම් නියමයක් සමඟ අනුකූලව කටයුතු කිරීම පැහැර හරින්නේ නම්;

(ඔ) යම් තැනැත්තකු විසින් අසත්‍ය සාක්ෂි හෝ අසත්‍ය තොරතුරු සැපයීම මගින් චේතනාන්විතව කොමිෂන් සභාව නොමඟ යවන්නේ නම්; හෝ

(ඕ) මෙහි 49 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන්නේ නම්,

එකී තැනැත්තා කොමිෂන් සභාවේ අධිකාර බලයට විරුද්ධව අපහාස කිරීමේ වරදට වරදකරුවකු විය යුතු ය.

(2) තැනැත්තකු, අපහාස කිරීමේ වරදට වරදකරු වන බවට පෙනී යන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, එකී කාරණය අභියාචනාධිකරණයට වාර්තා කරනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ අධිකාර බලයට එරෙහිව සිදු කරන ලද සෑම අපහාස කිරීමේ වරදක් අභියාචනාධිකරණයට එරෙහිව සිදු කරන ලද අපහාස කිරීමේ වරදක් ම ලෙස සලකා අභියාචනාධිකරණය විසින් ඒ සඳහා දඬුවම් පැමිණ විය යුතු ය.

සාක්ෂිකරුවන් සඳහා විශේෂ මුක්තිය

**46.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන සහ 140 වන ව්‍යවස්ථා යටතේ වූ නීති කෘත්‍යවල දී හැර, මේ පනත යටතේ ක්‍රියාකරනු ලබන කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයකුගේ, නිලධරයකුගේ හෝ සේවකයකුගේ කිසිදු නියමයක්, තීරණයක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක් යම් නීති කෘත්‍යයක දී හෝ යම් අධිකරණයක් ඉදිරිපිට අභියෝගයට ලක් නොකළ යුතු ය.

(2) කොමිෂන් සභාවේ හෝ එහි යම් සාමාජිකයකුගේ, නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නියමයකට, තීරණයකට, ක්‍රියාවකට හෝ නොකර හැරීමකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව මගින් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති රිට් අධිකරණ බලය අභියාචනාධිකරණය විසින් නොව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

නඩුවලින් ආරක්ෂා වීම

**47.** 45 වන වගන්තියට යටත් ව -

(අ) කොමිෂන් සභාවේ අධිකාර බලයට එරෙහිව අපහාස කිරීම සම්බන්ධයෙන් හැර, කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද නැතහොත් නොකර හරින ලද යම් ක්‍රියාවක් සඳහා කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකුට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු නොලැබිය යුතු ය;

(ආ) කොමිෂන් සභාව විසින් සද්භාවයෙන් සකස් කරන ලද වාර්තාවක් සම්බන්ධයෙන් ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකුට එරෙහිව හෝ ඒ වාර්තාව පිළිබඳ සාරානුකූලව සත්‍ය විස්තරයක් පළකිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු නොලැබිය යුතු ය; සහ

(ඇ) කොමිෂන් සභාවට යම් තැනැත්තකු සද්භාවයෙන් සාක්ෂි, තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ තැනැත්තාට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ හෝ පරිපාලන නඩු කටයුත්තක් පැවරීම නොකළ යුතු ය.

සාක්ෂි ආවේශ්‍ය නොකළ යුතු ය

**48.** කොමිෂන් සභාවේ කාර්ය සඳහා කොමිෂන් සභාව වෙත හෝ ඉදිරිපිට යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන හෝ දෙන ලද යම් ප්‍රකාශයක කිසිදු සාක්ෂියක්, යම් සිවිල් හෝ අපරාධ අධිකරණයක නඩුවක දී, අපරාධ නඩුවක දී හෝ වෙනත් නීති කෘත්‍යයක දී, එකී තැනැත්තාට එරෙහිව ආවේශ්‍ය නොකළ යුතු ය.

*අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඉල්ලීම මත විමර්ශන කල් තැබිය යුතු බව*

**49**. කොමිෂන් සභාවේ කාර්යභාරය තුළ තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ අතුරුදහන්වීම පිළිබඳ යම් පරීක්ෂණයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මඟින් එසේ ඉල්ලා සිටිනු ලැබුවහොත්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මඟින් සිදු කරන ලද පරීක්ෂණවලට අගතියක් කිරීමෙන් තොරව එකී විමර්ශන නැවත ආරම්භ කිරීමට කොමිෂන් සභාවට හැකි වන තාක්, කොමිෂන් සභාව විසින් එකී විමර්ශන කල් තබනු ලැබිය යුතු ය.

*රීති*

**50.** (1) කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ රීති සෑදීම සඳහා අවසර දී ඇති හෝ නියම කරන ලද යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම, ගැසට් පත්‍රයේ පළ කිරීම මත බලාත්මක විය යුතු ය.

*කොමිෂන් සභාව විසුරුවා හැරීම*

**51.** (1) කොමිෂන් සභාවේ ධූර කාලය අවසානයේ හෝ ජනාධිපතිවරයා වෙත අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමෙන් මාස තුනකට පසුව, කොමිෂන් සභාව විසිරිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසුරුවා හැරීමට පෙරාතුව, කොමිෂන් සභාව විසින් රහස්‍යගත තොරතුරු ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය හැකි පියවර සඳහා නිසි සැලකිල්ල ලබා දෙමින්, අනාගතයේ දී අවශ්‍ය වූ විටක දී යොමු වීම සඳහා එහි වාර්තා ලේඛනාරක්ෂණය කිරීම සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විමසා උචිත පියවර ගනු ලැබිය යුතු අතර කොමිෂන් සභාවේ ඉතිරිව ඇති දේපළ බැහැර කිරීම සංවිධානය කළ යුතු ය.

*මේ පනතේ විධිවිධාන වෙනත් නීති අභිබවා බලපැවැත්විය යුතු බව*

**52.** මේ පනතේ විධිවිධාන, වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, අදාළ විය යුතු ය.

*අර්ථ නිරූපණය*

**53.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"අගතියට පත් තැනැත්තකු" යන්නෙන්;

(අ) 12 වන වගන්තිය යටතේ විස්තර කරනු ලැබ ඇති ජීවිත අහිමි වීමක ප්‍රතිඵලයක් වශයෙන් තැනැත්තන්ට සිදු වූ හානියකින්, අලාභයකින් හෝ තැනැත්තන්ට හෝ දේපළවලට සිදු වූ හානියකින් හෝ අලාභයකින් පීඩාවට පත්ව ඇති වින්දිතයකු; හෝ

(ආ) මෙහි (අ) ඡේදය යටතේ විස්තර කරනු ලැබ ඇති වින්දිතයා මිය ගිය තැනැත්තකු හෝ 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ 27 වන වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පරිදි "අතුරුදහන් වූ තැනැත්තකු" නම්, එකී වින්දිතයාගේ ඥාතීන්,

අදහස් වේ;

"ළමයින්" යන්නෙන්, අවුරුදු දහඅටට අඩු තැනැත්තන් අදහස් වේ;

"තැනැත්තන්ට සිදුවන අලාභය හෝ හානිය" යන්නට, ශාරීරික හෝ මානසික අලාභයක් හෝ හානියක් ඇතුළත් වේ;

"දේපළවලට සිදුවන අලාභය හෝ හානිය" යන්නට, දේපළ විනාශ වීම, දේපළවලට අලාභ වීම, දේපළ අහිමි වීම හෝ අහිමි කරවීම ඇතුළත් වේ;

"ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 48 දරන ජාතික ලේඛනාරක්ෂක පනත යටතේ පිහිටුවන ලද ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව අදහස් වේ;

"අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය" යන්නෙන්, 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය

දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය අදහස් වේ;

"ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය" යන්නෙන්, 2024 අංක 1 දරන ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත යටතේ පිහිටුවන ලද ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය අදහස් වේ;

"හානිපූරණය සඳහා වන කාර්යාලය" යන්නෙන්, 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත යටතේ පිහිටුවන ලද හානිපූරණය සඳහා වන කාර්යාලය අදහස් වේ;

"අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය" යන්නෙන්, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පිළිබඳ පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අදහස් වේ;

මියගිය වින්දිතයකු හෝ අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් වන විට "ඥාතීන්" යන්නට -

(අ) කලත්‍රයා;

(ආ) ළමයින්;

(ඇ) දෙමව්පියන්;

(ඈ) සහෝදරයන් හෝ සහෝදරියන්;

(ඉ) නැන්දණිය හෝ මාමණ්ඩි, මස්සිනා හෝ නෑනා, බෑණා හෝ ලේලි;

(ඊ) මුණුබුරා හෝ මිණිබිරිය සහ ආච්චි හෝ සීයා,

ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**54.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.